**ජාතික ශිල්ප සභාව - 2019**

**-------------------------------**

## 1.1 ව්‍යාචනය කළ මතය

**-----------------------**

ජාතික ශිල්ප සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධ ආයතන පනතේ 20(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2. මතය ව්‍යාචනය සඳහා පදනම

**----------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ ව්‍යාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4. විගණන විෂය පථය**
**----------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳව වූ ප්‍රමිතයේ 106 වන වගන්තිය ප්‍රකාරව අයභාරය හා වියදම් අයිතම් ප්‍රමාණාත්මක වන විට ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතු වුවත්, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ගම්මාන සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ලැබූ අයභාරය යටතේ වූ එකතුව රු.18,592,230 ක් සහ වියදම් යටතේ වූ එකතුව රු.17,730,526 ක් පිළිබඳව ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය වෙන් වෙන්ව හෙළිදරව් කර නොතිබුණි. | ඇස්තමේන්තුගත මුදල ප්‍රමාණාත්මක වුවද, එක් වැඩසටහනක් බැවින් එක් ශීර්ෂයක් යටතේ ගිණුම්ගත කරන ලදී. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 – 106 වන වගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් විස්තර හෙළිදරව් කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 දරන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම පිළිබඳ වූ ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කළ යුතු වුවත්, වර්ෂයේ සත්‍ය මුදල් ගලා යාම සහ සත්‍ය මුදල් ගලා ඒම නොසලකා හැර ප්‍රමිතයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශය | මුදල් ප්‍රවාහය සැකසීමේදී ලාභයට බලපාන සත්‍ය ලෙස මුදල් ගළා යාම් සහ ගලා ඒම් නොවන වියදම් ලාභ/අලාභයට එකතු කිරීම හෝ අඩු කිරීම සිදු කරන ලදී. වත්කම් හා වගකීම් වල පසුගිය වර්ෂයට සාපේක්ෂව සිදු වූ වෙනස මූල්‍ය ප්‍රවාහයට ගළපා ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සකස් කළ යුතු අතර, ඒ සඳහා වන පැහැදිලි කිරීම් විගණන පරීක්ෂාවන් සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂාවට ප්‍රමාණවත් ලිඛිත පැහැදිලි කිරීම්ද විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | | |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අවසන් තොගය ලෙස රු.18,920,673 ක වටිනාකමක් දක්වා තිබූ නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 දරන තොග සම්බන්ධ ප්‍රමිතයේ 47 (අ) වගන්තිය ප්‍රකාරව භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ශිල්ප සභාවේ තොග ගණනය කිරීමේදී පිරිවැය සූත්‍රයක් භාවිතා කළ නොහැකි අතර, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිය යන අගයන් දෙකෙන් අඩු අගයට ගණනය කර හෙළිදරව් කර ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ප්‍රකාරව තොග සම්බන්ධව ගිනුම්කරණ ප්‍රතිපත්ති හා අවශ්‍ය පැහැදිලි කිරීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15 දරන ප්‍රමිතයේ 14 (C) වගන්තිය ප්‍රකාරව අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක වෙනස්කම් සටහනක් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 07 කට අදාළව එකතු වටිනාකම රු.5,298,258 ක විචලනයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව ප්‍රමාණාත්මක වෙනස්කම් සටහනක් මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී රු.5,828,720 ක් පෙර වර්ෂ ගැළපීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් වලට ගළපා තිබුණද, අදාළ ගැළපීම් පිළිබඳ විස්තර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | ප්‍රමිතය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ශිල්ප සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එකතුව රු.137,938,889 ක් වූ රජයේ ප්‍රදාන (Government Grant) ලෙස සටහන් කර තිබුණි. එසේ වුවත් එම රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම හා මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම සම්බන්ධව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන ඒ අනුව රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත. | ප්‍රමිතය ප්‍රකාරව රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීමටත්, ඒ සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමටත් ක්‍රියා කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ එකතු වටිනාකම රු.5,828,720 ක් වූ ප්‍රාග්ධන වියදම අයහාර වියදමක් ලෙස ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමේදී අදාළ වත්කම් මිලට ගැනීමට අදාළ ප්‍රාග්ධන දායකය රජයේ දායකයට එකතු කර නොතිබීම නිසා ඉහත වටිනාකමින් රජයේ දායකය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් වී තිබුණි. එසේම 2018 සහ 2019 වර්ෂයේදී ලැබී තිබුණු රු.7,412,490 ක ප්‍රාග්ධන දායක මුදලක් අයහාර ආදායම් ලෙස හඳුනා ගැනීමද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු සමුච්චිත ඌනතාවය ඉහත අගයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂයේ සිදු කරන ලද ගැළපීම් සමුච්චිත සංවර්ධන අරමුදල් ගිණුමට ගළපන ලද අතර, එකී වෙනස ප්‍රාග්ධන දායකත්වයට ගළපන ලදී. | ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාළ ප්‍රාග්ධන දායකය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. තවද අයහාර ආදායම් වැඩිපුර සටහන් කිරීම් නිවැරදි කළ යුතු අතර, පුනරාවර්ථන ආදායම් හා ප්‍රාග්ධන ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි සංවර්ධන සඳහා දරන ලද එකතුව රු.964,269 ක් වූ ප්‍රාග්ධන වියදමට අදාළ රජයේ දායකය අයභාර ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.964,269 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | අයභාර ආදායම් වැඩිපුර සටහන් කිරීම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ලී පෙට්ටගම් 20 ක් මිලදී ගැනීම සඳහා දරන ලද එකතුව වටිනාකම රු.1,013,224 ක් ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කිරීම නිසා එම වත්කම් වලට අදාළ ක්ෂය අනුපාත වල වෙනස්කම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය හා ක්ෂය වෙන් කිරීම් රු.202,645 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගොඩනැගිලි ගිණුම සහ ලී බඩු සහ සවිකිරීම් ගිණුම් නිවැරදි කිරීමට සහ ක්ෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුළ ශිල්ප සභාව සතු පුහුණු මධ්‍යස්ථාන 96 ක භාණ්ඩ අලෙවියෙන් උපයා තිබුණු රු.2,234,032 ක් වූ ලැබූ ආදායම් ඉතිරි කිරීමේ බැංකු ගිණුම් 96 ක තැන්පත් කර තිබුණු නමුත්, එම ආදායම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. ඉහතින් සඳහන් ආදායම් උපලේඛනයට ඇතුළත් නොකරන ලද තවත් බැංකු ගිණුම් 16 ක ශේෂයන් 2019 දෙසැම්බර් 31 දිනට තහවුරු කරගෙන නොතිබුණු අතර, එම බැංකු ගිණුම්වල ශේෂයන්ද උපලේඛනයෙන් අත්හැර තිබුණි. | පුහුණු මධ්‍යස්ථානවල පවතින ගිණුම් ශේෂයන් අවසාන ගිණුම් වලට ගැළපීමක් සිදු කර නොමැති අතර, දැන ගැනීම සඳහා පමණක් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර ඇත. මෙම ගිණුම් සියල්ල වසා දැමීමට කටයුතු කරමින් පවතී. | පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වල ඇති මුදල් සභාව නමින් වූ බැංකු ගිණුම් වලට මාරු කර ගැනීමටත්, එම විකුණුම් ආදායම් ගිණුම් වලට ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |
| (ඉ) 2019 දෙසැම්බර් 31 දිනට ශිල්ප සභාව සතු පුහුණු මධ්‍යස්ථාන 112 ක ඇති ස්ථාවර වත්කම් හඳුනාගෙන, තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය නිරවුල් කර ගැනීමෙන් පසුව වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | පුහුණු මධ්‍යස්ථාන වල ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කරන ලද එකතු වටිනාකම රු.964,269 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට කටයුතු නොකිරීම නිසා වර්ෂයේ ක්ෂය සහ ක්ෂය වෙන් කිරීම් රු.11,873 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | ක්ෂය සහ ක්ෂය වෙන් කිරීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | රජයේ බැංකු ජංගම ගිණුම් 02 කට අදාළව හඳුනා නොගත් හර හා බැර ශේෂ පිළිවෙලින් රු.48,616 ක් සහ රු.51,840 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි. | හඳුනා නොගත් හර කිරීම් වලට අදාළ නිවැරදි කිරීම් 2020 පෙබරවාරි මස හඳුනාගෙන ගිණුම්ගත කර ඇත. 2012 වර්ෂයේ සිට පැවත එන ශේෂ සඳහා ඉදිරියේදී කටයුතු කරමි. | බැංකු සැසඳුම් ප්‍රකාශ අදාළ ගැළපීම් සිදු කර නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ස්ථාවර වත්කම් | 85,930,638 | 41,534,383 | 44,396,255 | වෙනස දිගුකාලීනව පැවත එන අතර සියලු වත්කම් සම්බන්ධයෙන් වටිනාකම් තක්සේරු කර වෙනස නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ස්ථාවර වත්කම් සහ උපලේඛන අතර වෙනස්කම් හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණනය කර නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ) ජර්නල් සටහන් | 6,873,288 | ජර්නල් සටහන් 06 ක් සඳහා උපකාරක ලිඛිත සාක්ෂි හා උපකාරක ලියවිලි | ජර්නල් සටහන් වලට අදාළ උපකාරක සාක්ෂි මේ සමහ ඉදිරිපත් කරමි. | ජර්නල් සටහන් නිවැරදිතාව පරීක්ෂාව සඳහා සියලු ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොමැති අතර, ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් | 87,090,610 | සමීක්ෂණ මණ්ඩල වාර්තා | ඉදිරියේදී සියලු පළාත්වල භාණ්ඩ සමීක්ෂණය සිදු කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සමීක්ෂණ මණ්ඩල වාර්තා මුදල් රෙගුලාසි අනුව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) උපකරණ හා මෙවලම් | 2,334,110 | උපකරණ හා මෙවලම් ශිල්පීන් වෙත භාරදුන් බවට ලිඛිත සාක්ෂි | පිළිතුරු ලබාදී නැත | ශිල්පීන් ලිඛිතව භාණ්ඩ භාරගත් බවට ලිඛිතව සාක්ෂි ලබාගෙන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | රු. | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 9.1 වගන්තිය සහ 9.8 වගන්තිය | මෙම වගන්ති වලට පටහැනිව ඉන්දියාවේ හරියානා ප්‍රාන්තයේ පැවති ප්‍රදර්ශනයට සහභාගී වූ නිලධාරීන් සඳහා එකතුව රු.35,620 ක් උණුසුම් ඇඳුම් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | 2020 වර්ෂයේ සිට උණුසුම් ඇඳුම් දීමනාව නොගෙවීමට කටයුතු කරන ලදී. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 23.18 වගන්තිය | මෙම වගන්තිය ප්‍රකාරව දිවයිනෙන් බැහැරව ගතකරන නිවාඩු පිළිබඳව වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මාස් පතා නිවාඩු වාර්තාවක් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරනු ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |
| (ඇ) 2003 ඔක්තෝබර් 28 දිනැති පීඊඩී/17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) ඕමානයේ පැවති දෙවන හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයට සහභාගීවීම සඳහා චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබාදී නොතිබූ අතර, ආයතන සංග්‍රහයටද පටහැනිව පරිවාස කාලය තුළ සේවය කරන නිලධාරියෙකු විදේශ සංචාරයක් සඳහා සහභාගී කර එකතුව රු.123,273 ක් ගෙවීම් කර තිබුණි. | මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩ අනුමැතිය 2019 මාර්තු 07 දින ලබාගෙන ඇති අතර, එදිනම අනුමැතිය සඳහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී. භාණ්ඩාගාර අනුමැතිය ලබාදෙනු ඇතැයි අපේක්ෂාවෙන් අදාළ විනිමය නිකුත් කරන ලදී. නමුත්, මේ සඳහා නිවාඩු අනුමත නොවන බව 2019 මැයි 13 දින දන්වා ඇත. ඉදිරියේදී පරිවාස පිට සිටින නිලධාරීන් විදේශ ගමන් සඳහා යොමු නොකිරීමට කටයුතු කරමි. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමෙන් පසුව විදේශ සංචාර සඳහා නිලධාරීන් යොමු කිරීමටත්, විනිමය මුදා හැරීමටත් ක්‍රියා කළ යුතුය. |
| | (ii) ජපානයේ සංචාරයක් සඳහා සභාවේ අධ්‍යක්ෂකවරිය වෙත එකතුව රු.44,985 ක් අනියම් දීමනා වෙනුවෙන් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | මෙම සංචාරය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව සභාපතිතුමාගේ අත්සනින් ලිපියක් අමාත්‍යාංශය වෙත යොමු කළද, අමාත්‍යාංශය තුළ ප්‍රමාද වීම හේතුවෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රමාද කර ඉදිරිපත් කර ඇත. මේ සඳහා අනුමැතිය පසුව ලැබී ඇත. අනියම් දීමනාව US$ 75 ක් ගෙවා ඇති අතර, US$ 40 ක් අනුමත කර ඇත. ඒ සඳහා නැවත ඉල්ලීමක් සිදු කර ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව පූර්ව අයදුම් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් විදේශ සංචාර සඳහා සහභාගී විය යුතු වේ. තවද, චක්‍රලේඛයේ සඳහන් අනුමත ගාස්තු ප්‍රමාණයන් පදනම් කරගෙන විදේශ සංචාර සඳහා විනිමය මුදා හළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ලබාදෙන ලද අත්තිකාරම් මුදල් වර්ෂය අවසාන දිනට පෙර පියවිය යුතු වුවත්, 2000 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ ලබාදෙන ලද එකතු වටිනාකම රු.258,651 ක් වූ අත්තිකාරම් 2019 වර්ෂ අවසාන වන විටද පියවීම් කර නොතිබුණි. | මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය ලිපි යොමු කර ඇත. අනෙකුත් අත්තිකාරම් දීර්ඝ කාලයක් නිරවුල් නොවූ අත්තිකාරම් ලෙස පවතින බැවින් ඒවා පිළිබඳ ඉදිරියේදී සාකච්ඡා කර ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් ලබා දීමෙන් පසුව කාර්ය නිම වූ විගස අත්තිකාරම් පියවීමටත්, පැරණි නොපියවන ලද අත්තිකාරම් සොය බලා නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) 2015 ජූලි 14 දින අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | අතුරු අග්‍රිමයක් නිකුත් කළ කාර්ය අවසන් වී දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවත්, 2019 වර්ෂය තුළ විවිධ කාර්යයන් සඳහා ලබාදුන් එකතු වටිනාකම රු.1,666,100 ක් වටිනා අත්තිකාරම් පියවීම දින 102 සිට දින 11 දක්වා කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | මෙම අත්තිකාරම් දින 10 ක් ඇතුළත පියවීම් කළ නොහැකි අතර, කාර්යය නිම වූ විගස පියවන ලෙසට උපදෙස් ලබාදී ඇත. | මෙම චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් ලබා දීමෙන් පසුව කාර්ය නිම වූ විගස අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.688,034 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,068,562 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,380,528 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම රු.23,506,115 කින් අඩුවී තිබියදී, මුළු වියදම රු.29,886,643 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානයේ පිහිටි ශිල්ප සභාව භාරයේ පාලනය වන පොදු පසුකම් මධ්‍යස්ථානය වෙත එකතු වටිනාකම රු.249,430 ක් වටිනා විදුලියෙන් ක්‍රියා කරන ලී කැටයම් උපකරණ 05 ක් ඇහැලගල දැව කැටයම් ගම්මානය විවෘත කිරීමේදී ශිල්පීන්ගේ භාවිතය සඳහා භාරදී තිබුණි. එම ද්‍රව්‍ය ලැබූ බවට තොග පොත්වල සටහන් කර නොතිබූ අතර, පොත් පත් වලද සටහන් නොකර අනාරක්ෂිතව තබාගෙන තිබූ එම භාණ්ඩ අතරින් රු.74,300 ක් වටිනා සැන්ඩර් යන්ත්‍රය (Electric Sander) 2019 දෙසැම්බර් මස ශිල්ප ගම්මානයේ කේෂ්ත්‍ර විගණන පරීක්ෂාවන් සිදු කරන අවස්ථාව වන විට අස්ථානගතවී තිබුණි. මෙම ද්‍රව්‍ය අස්ථානගත වීමට අදාළව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම උපකරණ පුහුණු මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක බතික් හා අත් යන්ත්‍ර පාඨමාලා සඳහා අවශ්‍ය මැහුම් පුහුණුව ලබා දීමට යොදා ගනු ඇත. | 2016 වර්ෂයේ මිලදීගත් මෙම ද්‍රව්‍ය ඵලදායී කාර්යයක යෙදීමට හෝ ශිල්පීන් අතර බෙදා දීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | සීගිරිය හස්ත කර්මාන්ත ගම්මානයේ අලෙවි කුටි 18 ක් පැවති අතර, ඒවායින් අලෙවි කුටි 04 ක පමණක් ශිල්පීන් නිෂ්පාදන කටයුතු වල නිරතවී තිබුණි. අලෙවි කුටි විශාල ප්‍රමාණයක වහලය කැඩී ගොඩනැගිලි වලට හානි සිදු වී තිබූ අතර, ඒවා වල් බිහිවී සතුන් වාසය කරන බව නිරීක්ෂණය විය. සංචාරකයින් ආකරෂණය වන පරිදි ගම්මානය පරිපාලන හා කළමනාකරණය නොකිරීම නිසා ආදායම් නොමැති වීම මත ශිල්පීන් අලෙවි කුටි අතහැර ගොස් තිබූ අතර, මෙම වත්කම් නිසි පරිදි ඵලදායී කාර්යයන්ට යෙදවීමට සහ ඒවා ආරක්ෂා කර ගැනීමට සභාවේ වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | පිළිතුරු ලබාදී නැත | සංචාරකයින් ආකර්ෂණය වන ආකාරයට ශිල්පීන් සඳහා අලෙවි කුටි ලබාදී එය නඩත්තු කර පවත්වාගෙන යාමට කළමනාකරණ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී අමාත්‍යාංශ ප්‍රතිපාදන ලෙස එකතුව රු.1,290,486 ක් වැය කර මන්නාරම තාරපුරම් ගම්මානයේ ශිල්පීන් වෙත බෙදා දීමට 2019 දෙසැම්බර් මස අත් යන්ත්‍ර මැෂින්, මහන මැෂින් සහ උපකරණ මිලදීගෙන තිබුණි. ක්‍රියාකාරී සැලසුම් අනුව 2019 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කළ යුතුව තිබූ මෙම භාණ්ඩ බෙදා දීමේ කාර්යයන් 2020 ජූනි මස වන විටත් අවසන් කර නොතිබුණි. | මෙම උපකරණ ශිල්පීන්ට ඉදිරියේදී ලබා දීමට නියමිතව පවතී. ඒවා සිංගර් ආයතනය මගින් ඍජුවම පළාත් කාර්යාල වෙත භාරදී ඇත. | ශිල්පීන් සඳහා මිලදීගත් භාණ්ඩ කඩිනමින් ශිල්පීන් වෙත භාරදීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ මාතර දිස්ත්‍රික්කයේ ගම්මාන 04 ක් සංවර්ධනය කිරීම සඳහා එකතුව රු.11,500,000 ක් අමාත්‍යාංශය මගින් වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කරදී තිබුණි. එම කාර්යය ශිල්ප සභාව විසින් 2019 ජූලි ආරම්භ කර 2019 නොවැම්බර් 30 දින වන විට අවසන් කළ යුතුව තිබුණද, ඊට අදාළ සියළු භාණ්ඩ මිලදී ගැනීමට සහ මිලදී ගත් සියළු භාණ්ඩ බෙදා හැරීම 2020 ජූනි මස වන විටද අවසන් කර නොතිබුණි. | මෙම භාණ්ඩ සඳහා වවුචර් පත් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, අදාළ මුදල් ලැබුණු පසු මිලදී ගෙන ශිල්පීන්ට ද්‍රව්‍ය බෙදා දීමට කටයුතු කරමි. | ගම්මාන සංවර්ධන සඳහා මිලදීගත් භාණ්ඩ ශිල්පීන්ට බෙදා දීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 25 ක් සඳහා හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීමට පහසුකම් සැපයීම යටතේ අමුද්‍රව්‍ය සහ උපකරණ ලබාදීමට රු.1,500,000 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂ අවසානය වන විට දිස්ත්‍රික්ක 12 ක් සඳහා එකතුව රු.576,596 ක් වැය කර අමුද්‍රව්‍ය හා උපකරණ ලබාදී තිබුණි. ඒ අනුව මෙම කාර්ය ඉටු කිරීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 38 ක්ද දිස්ත්‍රික්ක ආවරණය කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 48 ක්ද විය. | ශිල්පීන්ගේ ඉල්ලීම් සහකාර අධ්‍යක්ෂකවරු මගින් ශිල්ප සභාව වෙත ලබාගත් අතර, අඩු පාඩු රහිතව නිවැරදිව එවන ලද ඉල්ලීම් සඳහා පමණක් ගෙවීම් කරන ලදී. වර්ෂ අවසානයේ සිදු කළ ඉල්ලීම් සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබූ අතර, 2020 වර්ෂයේ පළමු කාර්තුව තුළ භාණ්ඩ මිලදීගෙන ලබා දීමට කටයුතු කරමි. | සැලසුම් කළ පරිදි ශිල්පීන්ට උපකරණ හා අමුද්‍රව්‍ය ලබාදීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශිල්ප සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ හස්ත කර්මාන්ත ශිල්පීන් සඳහා කඩිනමින් රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට 2019 වර්ෂයේදී රු.3,200,000 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළද එම මුදලින් රු.150,000 ක මුදලක් පමණක් වැය කිරීම නිසා මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 5 ක් විය. | රක්ෂණ සංස්ථාව වෙත මුදල් ගෙවීමට ප්‍රතිපාදන නොමැති වීම හා ශිල්පීන් විසින් ඉදිරිපත් කළ තොරතුරු වල සත්‍යතාව පරීක්ෂා කිරීමෙන් පසුව ක්‍රියාත්මක කළ යුතු වූ බැවින් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | ශිල්ප සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනතේ 17(ඊ) වගන්තිය ප්‍රකාරව “ශිල්පීන් සඳහා වන සුභසාධන යෝජනා ක්‍රම ආරම්භ කිරීම සභාවේ ප්‍රධාන කාර්යයක් විය. මෙම කාර්යය සඳහා වාර්ෂිකව භාණ්ඩාගාරය මඟින් ලබාගෙන තිබූ ප්‍රතිපාදන 2019 වර්ෂය වන විට ක්‍රමයෙන් අඩුවී තිබුණි. ප්‍රදර්ශන, අලෙවි සල්පිල් හා වෙළඳපොල මඟින් 2015 වර්ෂයේදී පමණක් රු.173,200 ක ආදායම් ලැබී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී විවිධ ආපදාවන්වට ලක් වූ ශිල්පීන් 05 දෙනෙකු විසින් සහන ඉල්ලා තිබුණද, 2020 ජූනි මස දක්වා එම ශිල්පීන්ට සහන සැලසීමට සභාවේ කළමනාකරණය ක්‍රියා කර නොතිබුණි. | දීර්ඝ පිළිතුරක් ලබාදී ඇත. ඒ අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන නිසා මුදල් ආයෝජනය කළ නොහැකි වූ බවත්, 2019 වර්ෂයේ ඉල්ලීම් ලැබී තිබුණද, ශිල්ප සුරක්ෂා රක්ෂණ ආවරණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නියමිත වූ බැවින් ශිල්ප සුභසාධන වැඩසටහන තාවකාලිකව අත්හිටුවීමට උපදෙස් ලබාදෙන ලදී. | ශිල්ප සභා පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට ශිල්ප සභාව පිහිටුවා ඇති අතර, එම අරමුණු ලඟා කර ගැනීමට නිරන්තරයෙන් ක්‍රියා කළ යුතුය. තවද, ශිල්පීන් සඳහා සහන සැලසීමටද ක්‍රියා කළ යුතු වේ. |
| (ඈ)කාන්තා හා ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධන වැඩසටහනට 2019 වර්ෂයේදී රු.19,800,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම මුදලින් රු.8,483,095 ක් වැය කර ගම්මාන 05 ක වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. 2019 කාර්ය සාධන වාර්තාව අනුව මෙම වැඩසටහන මඟින් ලඟා කරගත් භෞතික කාර්ය සාධනය සියයට 80 ක් ලෙසත්, මූල්‍ය කාර්ය සාධනය සියයට 96 ක් ලෙසත් සටහන් කර තිබුණි. නමුත්, මාස 05 ක කාලයක් ගෙන සකස් කර විගණනයට ඉදිරිපත් කළ කාර්ය සාධන වාර්තාව අනුව භෞතික කාර්ය සාධන පිළිබඳ විස්තර සටහන් කර නොතිබූ අතර, මෙම වැඩසටහනේ මූල්‍ය කාර්ය සාධනය සියයට 42 ක පහළ අගයක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නැත. | විගණනයට නිවැරදි සංඛ්‍යා දත්ත ඉදිරිපත් කළ යුතු අතර, අවස්ථානුකූලව එකම කාර්යයක ප්‍රගතිය එකිනෙකට වෙනස්ව ඉදිරිපත් නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරිමට පහසුකම් සැපයීම (අමුද්‍රව්‍ය/ උපකරණ) යටතේ රු.2,300,000 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කර ශිල්පීන් 600 කට ප්‍රතිලාභ ලබාදීමට තීරණය කර තිබුණද, 2019 වර්ෂයේදී ඉන් රු.629,000 ක් වැය කර ප්‍රතිලාභීන් 31 කු වෙත ප්‍රතිලාභ ලබාදී තිබුණි. මෙහි මූල්‍ය කාර්ය සාධනය සියයට 27 ක් වූ අතර, භෞතික කාර්ය සාධනය සියයට 5 ක් විය. | පිළිතුරු ලබාදී නැත. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුගත ඉලක්ක සපුරා ගැනීමටත්, හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීමට පහසුකම් සැපයීමටත් ක්‍රියා කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් මස ඉන්දියාවේ පැවති තෙවන ජාත්‍යන්තර ශිල්ප සම්මාන උළෙලට සහභාගී වීමට දේශීය අරමුදල් නොමැති අවස්ථාවක මුදල් පවතින බව සඳහන් කරමින් අනුමැතියක් ලබාගෙන තිබුණි. මෙම කාලය තුළ සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයද ඉවත් වී සිටි අතර, රජයේ නිලධාරීන්ට විදේශ සංචාර වලට සහභාගීවීමද තාවකාලිකව නතර කර තිබුණි. ඒ අනුව ශිල්පීන්ගේ විවිධ කාර්යයන් සඳහා අනුග්‍රාහක ආයතන වල ආධාර මුදලින් ගොඩනගා තිබූ අනුග්‍රාහක අරමුදලේ තිබූ එකතුව රු.288,018 ක් ඉහත සංචාරය සඳහා අධ්‍යක්ෂකවරිය විසින් භාවිතා කර තිබුණි. නමුත් මෙම සම්මාන උළෙලට අදාළව ශිල්ප සභාවට විශාල කීර්තියක් ලබාදෙමින් සම්මානයක් හිමිකරගත් ශිල්පිනියට විදේශ සංචාරයට සහභාගී වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට හැකියාවක් නොමැති බව ශිල්පිනිය වෙත දැනුම්දී තිබුණි. ඒ අනුව ශිල්පීන්ගේ අභිවෘද්ධිය සඳහා පිහිටුවා ඇති ශිල්ප සභාව සහ එහි නිලධාරීන්, ශිල්පීන්ගේ ප්‍රයෝජනය සඳහාම ඇති කළ අනුග්‍රාහක අරමුදලේ මුදල් ශිල්පීන්ගේ අභිවෘද්ධිය සඳහා භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | සම්මානය දිනාගත් ශිල්පිනිය ශිල්ප සභාවට කැඳවූ අතර, විදේශ ගමන සඳහා සහභාගී වීමට කැමැත්ත විමසා සිටින ලදී. නමුත්, තම පෞද්ගලික මුදලින් මේ සඳහා වියදම් දැරිය නොහැකි බව සහ තනිව ගමන් කිරීමට හැකියාවක් නොමැති බව ශිල්පිනිය විසින් දන්වා සිටින ලදී. නමුත්, ඇයගේ නිර්මාණය රැගෙන යාමට හා දිනාගත් සම්මානය රැගෙන ඒමට අවශ්‍ය වූ බැවින් සභාවේ අධ්‍යක්ෂකවරිය මේ සඳහා සහභාගී විය. | රජයේ උපදෙස් සහ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් රහිතව ක්‍රියා නොකළ යුතු අතර, සම්මානය හිමිකරගත් ශිල්පියා / ශිල්පිනිය විදේශ සංචාරය සඳහා සහභාගී කරවීම සඳහා සභාව ක්‍රියා කළ යුතුව තිබුණි. අනුග්‍රාහක අරමුදලේ මුදල් එය පිහිටුවීමේ අරමුණු කළ කාර්යය සඳහා යෙදිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නීතිපතිතුමාගේ සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ජපානයේ “ආසියානු පැසිපික් කලාපයේ අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය” සමඟ එකඟතා ගිවිසුමකට එළඹී තිබුණි. ගැටුම්වලින් පීඩාවට පත් වූ ආසියානු රටවල අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් කඩිනමින් ආරක්ෂා කිරීම සඳහා වන අධ්‍යයනයක් සිදු කිරීම මෙම ගිවිසුමේ අරමුණ විය. එම පර්යේෂණ වාර්තා සකස් කිරීම සහ අධ්‍යයනයන් සිදු කිරීම සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් වී නොතිබූ අතර, ඒ සඳහා 2018 සහ 2019 වර්ෂවලදී පිළිවෙලින් රු.79,651 ක් සහ රු.368,169 ක් වියදම් කර තිබුණි. | මේ සඳහා දීර්ඝ පිළිතුරක් ලබාදී ඇති අතර, එම පිළිතුරෙහි සඳහන් පරිදි, ගිවිසුම අත්සන් කිරීමේ කඩිනම් අවශ්‍යතාවය සලකා බලා නීති නිලධාරීගේ නිර්දේශ ලබා ගැනීමටද ප්‍රමාද වූ බැවින් නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමෙන් තොරව මෙම ගිවිසුමට එළඹීමට කටයුතු කරන ලදී. ඉදිරියේදී විදේශ ආයතන සමඟ ගිවිසුම් වලට එළඹීමේදී අදාළ විධිවිධාන අනුව ක්‍රියාත්මක වන ලෙස උපදෙස් ලබා දෙන ලදී. ප්‍රාග්ධන වැය යටතේ වූ වෙනත් විදේශ ප්‍රදර්ශන සඳහා ලැබූ ප්‍රතිපාදන වලින් මෙම වියදම පියවා ගැනීමට කටයුතු කර ඇත. මෙම පර්යේෂණ වාර්තාව කඩිනමින් සකස් කිරීමට කටයුතු කරනු ඇත. | නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමෙන් පසුව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණක් විදේශ රටවල් හා සංවිධාන සමඟ එකඟතා ගිවිසුම් වලට එළඹිය යුතුය. එසේ අවසරලත් ගිවිසුම් වලට පමණක් රාජ්‍ය මුදල් වැය කළ යුතුව තිබුණි. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොල්ගොල්ල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2016 දෙසැම්බර් මස 28 දින එකතුව රු.459,900 ක් වැය කර සිංගර් මහන මැෂින් 10 ක් සහ මෝටර් 01 ක් මිලදීගෙන තිබුණි. එම මැෂින් 10 ට අමතරව සාමාන්‍ය මහන මැෂින් 04 ක් සහ සිග්සැග් මැෂින් 04 ක් ඇතුළුව එකතුව මැෂින් 18 ක් ශිල්පීන්ගේ අවශ්‍යතා සඳහා බෙදා හැරීම හෝ ශිල්පීන් පුහුණුව සඳහා භාවිතා කිරීමකින් තොරව, වසර 03 ක පමණ කාලයක් තිස්සේ සමාලෝචිත වර්ෂය වන විටද පොල්ගොල්ල පළාත් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු අංශය තුළ කිසිදු ඵලදායී කාර්යයකට භාවිතා නොකර ඒවා ඇසුරුම් කළ පෙට්ටි තුළට නිෂ්කාර්යාව ගොඩ ගසා තිබුණි. | මෙම උපකරණ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන අතර, ඉදිරියේදී නිසි සැලසුම් සකස් කර අවශ්‍යතා හඳුනාගෙන උපකරණ මිලදී ගැනීමට කටයුතු කරනු ඇත. | රජයේ මුදල් භාවිතා කර ශිල්පීන් පුහුණු කිරීම සහ ශිල්පීන් වෙත ලබාදීමට මිලදී ගනු ලබන භාණ්ඩ අදාළ කාර්යයන් සඳහා යොදා ගැනීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විදේශ සංචාරයක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ශිල්ප සභාව විසින් එකතුව රු.123,273 ක් ගෙවීම් කර තිබුණි. අදාළ සංචාරයට සහභාගී වූ පරිවාස කාලය තුළ සේවය කළ නිලධාරියා සංචාරය නිම වී මාස 04 කට පසුව සේවයෙන් | මෙම නිලධාරියා සේවයෙන් ඉල්ලා අස්වී ඇති අතර, අදාළ නිරවුල් කිරීම් කටයුතු සිදු කරන තුරු ඉල්ලා අස්වීම පිළිගත නොහැකි බව ලිඛිතව දැනුම්දී ඇත. | ආයතන සංග්‍රහය සහ විදේශ ගමන් සඳහා වලංගු චක්‍රලේඛ වලට අනුකූලව පමණක් විදේශ සංචාර සඳහා සහභාගී කරවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉල්ලා අස්වී තිබුණි. මෙම සංචාරය සඳහා වැය කළ නිෂ්කාර්යා වියදම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.10,896,660 ක් වූ නිෂ්පාදන අමුද්‍රව්‍ය ලෙස ශිල්පීන්ට බෙදාහැරීමට මිලදී ගත් රිදී පබළු තොගය ශිල්පීන්ට ලබාදීමට කටයුතු නොකිරීම නිසා නිෂ්කාර්යා වත්කම් ලෙස පැවතුණි. | මෙම රිදී තොගයෙන් කොටසක් ශිල්පීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව මිල අඩු කර ශිල්පීන්ට ලබාදීමට සුදුසු බව අධ්‍යක්ෂ මණ්ඩලය පෙන්වා දී ඇත. | දිගුකාලයක සිට අලෙවියෙන් තොර ශිල්ප සභාවේ ඇති මෙම රිදී තොගය ශිල්පීන් වෙත නීත්‍යානුකූල පදනමකින් ලබාදීමට ක්‍රියා කිරීම සුදුසු වේ. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ජනවාරි 25 දින අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේදී කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාලසීමාව දීර්ඝ කිරිමට අදාළව කාර්ය සාධන සුරක්ෂණයේ කාලය දීර්ඝ කරගෙන නොතිබුණි. | නිරීක්ෂණය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව භාණ්ඩ සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තු වලදී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට නොඅඩු යෝග්‍ය සුරක්ෂණයක් ලබා ගත යුතුය. ප්‍රසම්පාදනය පිරිනැමීමේ කමිටු තීරණ වලදීද කාර්ය සාධන සුරක්ෂණ ලබාගත යුතු බව දන්වා තිබියදී, ගම්මාන සංවර්ධන වැඩසටහන සඳහා එසේ කාර්ය සාධන සුරක්ෂණ ලබා ගැනීමකින් තොරව එකතු වටිනාකම රු.14,650,476 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි. | සංවර්ධන කාර්යය කඩිනමින් සිදු කිරීමේ අරමුණින් මෙසේ මසකට අඩු කාලයක් ඇතුළත ද්‍රව්‍ය ලබාගෙන ඇත. කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට සහ කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා එළඹීම ප්‍රායෝගිකව සිදු කිරීමට අපහසු වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 සහ ප්‍රසම්පාදන කමිටු තීරණ ප්‍රකාරව ගිවිසුමකට එළඹිය යුතු බවට තීරණය කර තිබියදී, එසේ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමෙන් තොරව එකතුව රු.8,779,316 ක් වටිනා ද්‍රව්‍ය ගම්මාන සංවර්ධන වැඩසටහන සඳහා සැපයුම්කරුවන්ගෙන් මිලදීගෙන තිබුණි. | සංවර්ධන කාර්යය කඩිනමින් සිදු කිරීමේ අරමුණින් මෙසේ මසකට අඩු කාලයක් ඇතුළත ද්‍රව්‍ය ලබාගෙන ඇත. කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට සහ කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා එළඹීම ප්‍රායෝගිකව සිදු කිරීමට අපහසු වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය ප්‍රකාරව වැඩ සඳහා පිරිවිතර සහ කොන්දේසි වලට අනුකූලව වැඩ ඉටු කර ඇති බවට වැඩ අවසන් කිරීමේ සහතිකයක් ලබාගත යුතු වුවත්, එසේ සහතිකයක් ලබා ගැනීමකින් තොරව එකතු වටිනාකම රු.3,104,426 ක් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැඩ නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි මේ සමඟ ඉදිරිපත් කරමි. | පිළිතුර සමඟ කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ශිල්ප සභාවේ සේවක මණ්ඩලය පිළිබඳව පරීක්ෂා කිරීමේදී ද්විතියික මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාව 219 ක් වූ අතර, එම මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 174 ක් විය. ඒ අනුව එම මට්ටමේ සේවකයින් 45 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය විය. මෙම කාර්ය මණ්ඩල ඌනතාවය ආයතනයේ කාර්ය භාරය ඉටු කිරීමේදී ප්‍රමාදයන් සඳහා හේතු වී තිබුණි. | ප්‍රථමික මට්ටමේ සේවකයින් භාණ්ඩාගාර ලේකම්තුමාගේ 2019 නොවැම්බර් 20 දිනැති ලිපිය අනුව දැනට බඳවා ගැනීම් අත්හිටුවා ඇත. ඒ අනුව විශේෂ අනුමැතියක් මත බඳවා ගැනීමට නියමිතය. ඉතිරි තනතුරු පිරවීම සඳහා අදළා අනුමැතිය ලැබීමෙන් පසු කටයුතු කරනු ඇත. | ආයතනයේ අරමුණු නොපිරිහෙලා ශිල්පීන්ට ඉටු කිරීම සඳහා අනුමත සහ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ඉහළ කළමනාකරණය ක්‍රියා කළ යුතුය |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ශිල්ප සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කර තිබූ, විගණන විමසුම් 18 කින් විමසුම් 17 කට පිළිතුරු ලබාදීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය කළමනාකරණය විසින් ඵලදායීව හා කාර්යාක්ෂම ලෙස ආයතනයේ පාලන කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | පිළිතුරු ලබා නොදුන් නිලධාරීන් වෙත සිහිකැඳවීම් ලිපි ලබාදීමට කටයුතු කර ඇත. | අභ්‍යන්තර විගණන අංශය මනා අධීක්ෂණයකින් යුතුව පාලනය කර පවත්වා ගැනීමටත්, එම අංශ සොයා ගැනීම් ආයතනයේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමටත්, වැරදි අඩුපාඩු නිවැරදි කිරීමටත් කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 07 කට අදාළව එකතු වටිනාකම රු.4,108,541 ක් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දරා තිබුණි. එම වැය විෂයයන් වල අයවැයගත සංඛ්‍යා ඉක්මවූ සත්‍ය වියදම සියයට 15 සිට සියයට 341 ක් දක්වා වූ පරාසයක විහිදී පැවතීම නිසා පූර්ව වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. | අයවැය ඇස්තමේන්තුගත සීමාවන් තුළ වියදම් දැරීමට ක්‍රියා කළ යුතුය. |